

බුදුරජාණන් වහන්සේ මරගණන් පැරදවීම

## ❊ සඳහම් දැනුම

– වහුමුවේ විජයවංශ නා හිමි

බුදු දහම සහ ඊට අදාළ අනෙකුත් විෂය කරුණු පිළිබඳ පාඨකයා දැනුවත් කරන – කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් විශේෂාංගයකි. දහම හදාරන සිසුන් ඇතුළු සියලු දෙනාට ප්‍රයෝජනවත් විශේෂාංගයකි.

## ❊ ආත්මවාදය මනෝ මූලික සංකල්පයකි

– පිටිදූවේ සිරිධම්ම හිමි

'ආත්මවාදය' නමැති ප්‍රාග් බෞද්ධ යුගයේ සිටම පැවති සංකල් පය සාවද්‍ය බව බුදු රදුන් දේශනා කොට ඇත. මෙම ලිපිය නූතන මනෝ විද්‍යා පර්යේෂණ නිගමන සමග බෞද්ධ ඉගැන්වීම් තුලනාත්මක ලෙස විග්‍රහ කර 'ආත්ම' සංකල්පයෙහි සාවද්‍යතාව පෙන්වා දීමට දරන ලද උත්සාහයක් හැටියට හැඳින් විය හැකි ය.

## ❊ බෞද්ධ ප්‍රතිපත්තිවලට තැන නොදී බුද්ධාගමට තැන දෙන්න බෑ

– ආචාර්ය ඩබ්ලිව්.ඇස්. කරුණාරත්න

රජය හා සමාජය තුළ බුදු සසුනට ප්‍රමුඛස්ථානය ලබාදීමට උත්සාහ දරන අයට – ඒ සඳහා බෞද්ධ ප්‍රතිපත්ති වර්ධනය කිරීම ප්‍රමුඛ අවශ්‍යතාවක් බව පැහැදිලි කැරෙන ලිපියකි. ජීවිත අවබෝධය හා දැහැමි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම – අන්‍යයන් ද බුදු සසුන වෙත ආකර්ෂය කර ගැනීමේ එකම මග බව ලේඛකයා පවසයි.

## ❊ හොඳ – නරක පිළිබඳ බෞද්ධ ආකල්පය

පුද්ගලයාගේ ක්‍රියාවෙහි – වදනෙහි සහ සිතිවිල්ලෙහි සාවද්‍යතාව හා නිරවද්‍යතාව විග්‍රහ කැරෙන බෞද්ධ මිනුම් දඬු – විවිධ ආගම් සහ සමාජ කොටස් විසින් විවිධ අයුරින් විග්‍රහ කරන පුද්ගල ක්‍රියාවේ නිරවද්‍යතාව තීරණය කිරීම සඳහා බුදු වදනෙන් ලැබී ඇති මග පෙන්වීම හෙළිදරව් කර ගැනීමට මෙම ලේඛකයා උත්සාහ දරයි.

## ❊ පැසසුම් ලබන මඟ

– දිවියාගහ යසස්සි නාහිමි

කීර්ති ප්‍රශංසා ලබන සාර්ථක චරිතයක් ගොඩනඟා ගැනීම සඳහා අවශ්‍ය ගුණාංග කිහිපයක් පැහැදිලි කැරෙන බුදු වදනකට අර්ථකථනයක ඇතුළත් ලිපියකි; 'සාර්ථක ජීවිතයකට ධම්ම පදයෙන්' විශේෂාංගය යටතේ මෙවර පළ වන්නේ.

## ❊ 'බෝසතුන්ගේ උදාර ධර්මතා' පස් මහ බැලුම්

බුදු බව පතා පාරමී ධර්ම සපුරා – අවසන් භවයට පෙර භවයේ දෙව්ලොව වෙසෙන බෝධිසත්වවරයකු – තමන් බුද්ධත්වය ලබන අවසන් භවයට අදාළව නිරීක්ෂණය කරතැ'යි සැලකෙන ස්ථානය – කාලය ආදී වූ වැදගත් කරුණු කිහිපයක් සහ ඒවා එසේ නිරීක්ෂණය කිරීමට හේතු කවරේද'යි විග්‍රහ කැරෙන ලිපියකි.

## ❊ තලු මර මර මස් කන්නන් මනසින් උසස් වූ මිනිස්සු ද?

– වෛද්‍ය ඩී.පී. අතුකෝරල

සත්ව මාංශ අනුභවයේ අයෝග්‍යතාව. සත්ව මාංශ මිනිසාගේ සෞඛ්‍යයට අහිතකර බවත් – මිනිස් සදාචාරයට නොගැලපෙන බවත් – බුදුරදුන් විසින් අනුමත නොකරන ලද්දක් බවත් තහවුරු කිරීමට දරන උත්සාහයක් හැටියට මෙම ලිපිය හැඳින්විය හැකිය.

## ❊ බෞද්ධයා අන්‍යාගම් වෙත යොමු කිරීම: පිළියම් යෙදීම ප්‍රමාද කළ යුතු නෑ

ශ්‍රී ලාංකික සමාජය තුළ ජීවත්වන බෞද්ධයන් අන්‍යාගම් වෙත යොමු කරවීමේ විවිධ ප්‍රයෝගකාරී ප්‍රයත්න පිළිබඳ විරෝධතා පැන නැගෙමින් පවතින යුගයක – අදාළ ප්‍රශ්නයට හේතු වී ඇති සමාජ දුබලතා දුරුකර – බුදුසසුන රැක ගත යුතු නිවැරැදි මග පැහැදිලි කර ගැනීමට දරන ලද උත්සාහයකි, මෙම ලිපිය.

## තිරාණගම ශ්‍රී සුනන්දාරාමය

– කේ. ඉන්ද්‍රරත්න

ගාල්ල දිස්ත්‍රික්කයේ තිරාණගම නමැති ග්‍රාමයේ පිහිටි පැරණි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු.

## සමථ භාවනාවෙන් විදර්ශනා භාවනාවට

– පොතුහැර විපස්සි හිමි

බෞද්ධ භාවනා ක්‍රම හඳුන්වා දෙන ලිපියකි. මජ්ඣිම නිකාය නම් වූ ත්‍රිපිටක ග්‍රන්ථයේ අට්ඨකතාහර සූත්‍ර දේශනාව ඇසුරෙන් මෙම ලිපිය සකස් කර ඇත.

## වස් විසීම හා කඨින චීවර පූජාව

– දිගනතැන්නේ ශ්‍රී සුමංගල නාහිමි

වස් විසීම නමැති ඓතිහාසික ශාසනික සම්ප්‍රදායේ ස්වභාවය සහ එහි ඉතිහාස කතාව. වස් ප්‍රවාරණයෙන් පසු සිදු කැරෙන කඨින චීවර පූජා පින්කමේ ආනිශංස.

## උත්තම ගුණයකි ඉවසීම

– කෝමාරිකේ රාහුල හිමි

ඉවසීමේ අනුසස්. ක්‍රෝධ නොකිරීම නමැති ගුණාංගය – ජීවිත සාර්ථකත්වයට පදනමක් වන අයුරු. ක්‍රෝධයෙහි ආදීනව හා ඉවසීම පිළිබඳ බුදු වදන්.

## Religious Approach to Peace Through Libreration of our Hearts and Minds

*-by Bogoda Premaratne (Founder-Treasurer & Present Director World Buddhist Peace Foundation)*

## මිල්ලතේකන්ද වන අරණ

– ජනක වෙත්තසිංහ

'සිත් සනසන සෙනසුන' විශේෂාංගය යටතේ – ගම්පහ දිස්ත්‍රික්කයේ නිට්ටඹුව සිට ඌරාපොළ හරහා කිරිඳිවැල වෙත ගමන් කරන විට හමු වන මිල්ලතේ හන්දියෙන් හැරී යන විට හමුවන භාවනා මධ්‍යස්ථානයකි.

## මාළිගාවිල පුද බිම

– නිර්මලා අමරසිංහ

මොනරාගල දිස්ත්‍රික්කයේ – බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ – ඔක්කම්පිටිය ග්‍රාමයේ පිහිටි ප්‍රකට සුවිශාල බුද්ධ ප්‍රතිමාවක් සහ බෝසත් ප්‍රතිමාවක් පිළිබඳ විස්තර ඇතුළත් ලිපියකි.

## අධිපෝෂණය රෝගී වීමට හේතුවක් නිවන් මඟට බාධාවක්

– තෙළඟපාත ධර්මකීර්ති නා හිමි

බුදු දහමේ දක්වෙන නිවැරැදි ආහාර පරිභෝජන රටාව පිළිබඳ විමසුමකි. රස තණ්හාවෙහි සහ අධිපෝෂණය ලැබීමට උත්සාහ දැරීමේ පිළිවෙතෙහි අයෝග්‍යතාව බුදු වදන් සහ වෛද්‍ය විද්‍යාත්මක පර්යේෂණ 'ප්‍රතිඵල' මගින් හෙළිදරව් කිරීමට දරන උත්සාහයකි.

## දෙවියන්ගෙන් වැඳුමට පාත්‍ර වේ නම් ඔහු සැබෑ බෞද්ධයෙකි

– ගොඩගම චන්ද්‍රදස්සී තෙරණිය

බුදු සසුනක් පවතින අවස්ථාවකදී මිනිස් භවයක් ලැබීමේ වටිනාකම. දෙවියන්ගේ පවා ගෞරවයට ලක් වන බෞද්ධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම.